ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)
උපාධි වැඩසටහන- 6 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU6234 - ප්‍රාථමික පන්තිකාමර කළමනාකරණය**
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - **2023.03.18** | වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**1 වන කොටස**

01. 'අධ්‍යාපන කළමනාකරණය' යන යෙදුම නිර්වචනය කරන්න.

02. කළමනාකරණයේ අවශ්‍යතාව සඳහා කරුණු තුනක් (03) සඳහන් කරන්න.

03. 1982-1984 කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය ශ්‍රී ලංකා අධ්‍යාපන කළමනාකරණ ප්‍රතිසංස්කරණ ආරම්භ කරන ලදී. ඒවා මොනවා ද?

04. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා හඳුන්වා දී ඇති නිපුණතා හත නම් කරන්න.

05. ප්‍රාථමික පාසලකට අවශ්‍ය සම්පත් වර්ග කරන්න.

06. පාසලක් විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වර්ග මොනවා ද?

07. ප්‍රාථමික පාසල්වල දෙමාපිය සබඳතා වැදගත් වන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ප්‍රාථමික පාසලක ක්‍රියාත්මක කළ හැකි විෂය-සමගාමී ක්‍රියාකාරකම් පහක් (05) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) 1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මගින් පළාත් සභා පිහිටුවීමෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය අධ්‍යාපන පරිපාලනයේ සිදු වූ වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පාසල් සංවර්ධන මණ්ඩලයේ කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) අධීක්ෂණය යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඵලදායී අධීක්ෂකවරයකුට අධීක්ෂණය සඳහා තිබිය යුතු ගුණාංග උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

11. (i) කලාප අධ්‍යාපන කාර්යාලයක සංයුති සටහනක් දක්වන්න. (ලකුණු 08)

(ii) කලාප අධ්‍යාපන කාර්යාලයකට පවරා ඇති ක්‍රියාකාරකම් ලැයිස්තුගත කරන්න. ඔබ ලැයිස්තුවේ සඳහන් කර ඇති ක්‍රියාකාරකම් අතුරින් තුනක් තෝරාගෙන එම ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. (i) සමෝධානිත ඉගෙනුම් ප්‍රවේශය තුළ ගුරුවරයා පන්ති කාමරය කළමනාකරණය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ප්‍රාථමික පන්තිකාමර කළමනාකරණයේ දී ගුරුවරයාට මුහුණදීමට සිදුවන ගැටලු මොනවා ද? (ලකුණු 06)

(iii) එම ගැටලු විසඳීමට ඔබට ඉදිරිපත් කළ හැකි යෝජනා මොනවා ද? (ලකුණු 10)

13. (i) 'සම්පත් කළමනාකරණය' යනු කුමක් ද? (ලකුණු 04)

(ii) ප්‍රාථමික පාසල්වල සම්පත් කළමනාකරණයට බලපාන සාධක විස්තර කරන්න. (ලකුණු 06)

(iii) සම්පත් කළමනාකරුවකු ලෙස ප්‍රාථමික ගුරුවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.